### 1 වන පිටුවෙන් - නිදහසට 60 පිරේ.....

දේශපාලන පක්ෂත්, වාමාංශිකයයි කියාගැනුණු පටු දර්ශනයකින් යුත් පක්ෂත් මෙම වර්ගවාදී ගැටුම පිඹි මින් මෙලවූහ. එහි අවාසනාවන්ත ආදීනව තවමත් අපි දෙගොල්ලම විඳිමු. සමහර අපේම මෝඩයින් වුවද නොදැනුවත්කම නිසා මේ සියල්ලේ වරද 56 යුගයේ දේශපාලකයින්ට පටවා කතාකරනු ඇසේ.. නමුත් එය අප රටේ ඉදිරි ගමනට ගතයුතුව තිබුණු අත්‍යවශ්‍ය පියවරක් බව උන්ට වැටහීමක් නැත.

එයට පෙර විදේශීය ව්‍යාපාර යටතේ තිබුණු ආර්ථික නිශ්පාදනය සහ දේශීය නිශ්පාදන රාශියක්ද, නව නිශ්පාදනද රජය යටතේ සංස්ථා පිහිටුවන ලදින් රාජ්‍ය කේන්ද්‍රීය ජාතික නිශ්පාදන පදනමක් ස්ථාපිත කෙරිණ. සේවක වරප්‍රසාද අර්ථ සාධක අරමුදල ආදිය මගින් රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවකයන්ට විශාල සහන ලබාදිණ. ලංගම ආදිය පිහිටුවා ගමනා ගමන සේවා දියුණු කෙරිණ. මහා විද්‍යාල, නව විශ්ව විද්‍යාල ආදිය පිහිටුවා අධ්‍යාපනය මහාපරිමාණයෙන් ව්‍යාප්ත කරමින් සංශෝධනය කරන ලදී. ජාතික අධ්‍යා පන ක්‍රමයක් ක්‍රියාවට නැගිණ. මේවා නිකම්ම සිදුවූවා නොවේ. වරප්‍රසාද ලත් පන්තිය මේවාට හැම අවස් ථාවකම සිදු කළ හරස් කැපිලි හා බාධක මධ්‍යයේය.

1960-70 ගණන් වල රටේ ඇතිවූ සංස්කෘතික පිබිදීම මෙම ඉදිරියට යෑමේ ප්‍රථිඵල වෙති. සිනමාව නාට්‍යය,සාහිත්‍යය, ලේඛනය ආදී අංශයන්හි එම යුගයේ නව නිර්මාණ බොහොමයක් ජාත්‍යන්තර මට්ටමෙන් පවා ඉතා ඉහළ ගණයේ ඒවා වීය. මේ දැක්වූයේ ඒ පිබිදීමේ සමහර අංග පමණකි. නමුත් මෙයට වැඩිකල් ඉදිරියට යෑමට ඉඩ නොලැබිණ.

#### දෙවන තිස් වසර
#### 1978 - අද දක්වා - පරිහාණි යුගය

1978 සමයේ බටහිර බලයට ආ රොනල්ඩ් රීගන් මාග්‍රට් තැචර් ප්‍රමුඛ නව ලිබරල් වාදී රැල්ල යටතේ විවෘත ආර්ථික ක්‍රමයත් ලෝක වෙළඳ පොළ ආදියත් අප රටවලටද තදින් බලපාන්නට පටන් ගැනිණ. ඒ වන විටත් ප්‍රබල ආර්ථිකයක් ගොඩනගාගෙන සිටි ඉන්දියාව මැලේසියාව වැනි රටවල් මෙම රැල්ලට තදින් යටනොවුණද අපගේ වැනි යම්තම් මතුවී එන දේශීය ආර්ථිකයන් පහසුවෙන් එයින් බිඳ වැටිණ. 1977 දී නැවත බලයට පැමිණි විදේශ ගැති පන්තිය එතෙක් අප රටේ ක්‍රමයෙන් ඉදිරියට යමින් තිබුණු පිබිදීම් මොට කරලීම ආරම්භ කළහ. දේශීය ආර්ථිකයේ පදනම වූ අර සංස්ථා, ගමනාගමන ආදිය පෞද්ගලික කරලමින් ඒවා බිඳලන ලදී. මංකොල්ලකාර විවෘත ආර්ථිකයකට ජනතාව බිලිකරන ලද අතර ඔවුන් දේශීය හා විදේශීය ධනපතියනට පහසු ගොදුරු විය.

තරමක් හෝ සමනය වෙමින් තිබුණු ඇති නැති පරතරය තව තවත් උග්‍රවෙමින් පවතී. මේවාට එදිරිව නැගී සිටි තරුණ පන්තිය භීෂණ සමයක් මතුකර ලමින් ඝාතනය කරනු ලැබිණ. දූෂණ වංචා පගාව ඉහ වහා යමින් ඒවා සාමාන්‍ය සමාජ ලක්ෂණ බවට පත්ව ඇත.

දියුණුවට පත්වෙමින් ආ කලා, සාහිත්‍ය හා මාධ්‍ය අංශ අද දැඩි පිරිහීමකට පත්ව ඇත. විශේෂයෙන් ගුවන් විදුලි හා ටෙලිවිෂන නාලිකා සහ සමහර පුවත්පත් සංස්කෘතිය හා සාරධර්ම කෙළෙසමින් දුෂ්චරිත පතුරුවන්නන් බවට පත්ව සිටිති.

මුලදී සඳහන් කළ වර්ගවාදී සිංහල දෙමළ ගැටුම අද වනවිට උග්‍ර තත්වයකට පත්ව ලෝකයේ ඉතා විෂම ත්‍රස්තවාදී ව්‍යාපාරයක් වූ කොටින් ගෙනයන රට දෙකඩ කරලීමේ යුද්ධයක් බවට පෙරළී ඇත. මෙයට මෑත යුගයේ දේශපාලනඥයින්ගේ බලලෝභී කුලල් කාගැනීම් සහ පිරිහීමද තුඩු දින. සමාජ පිරිහීම සමග ඔවුන්ද දූෂණයට පත්ව පිරිහී ඇත.

දැන් දැන් ටිකෙන් ටික මෙම තත්වයන්ගෙන් මිදීමට පාලනයට පත්වූ අය, හමුදාවන් සහ ජනතාව අවදිව සිටිමින් ප්‍රයත්නයේ යෙදෙනු දැක්ම තරමක හෝ සතුටට කරුණකි. මේවා සමාලෝචනය කරමින් නැවත පිබිදීමට උත්සාහයක යෙදීම අප හැම දෙනාටමද අපේ දේශයටද නව මගකට පිවිසීමට උදව්වනු ඇත.



## ශ්‍රීලංකාවේ ප්‍රථම අගමැතිඳු ප්‍රථමයෙන් ලන්ඩනයට ආ දා

**1948** ලංකාවට නිදහස ලැබී සතියකට පසු ලන්ඩනයට පැමිණි නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ඩී. ඇස්. සේනානායක මැතිතුමා ඇතුළු පිරිස එවකට එංගලන්තයේ තිබුණු ශ්‍රීලාංකික තරුණ ශිෂ්‍ය සංගමයේ සභාපති තිස්ස විජයරත්න මහතා විසින් පිළිගන්නා ලදි. සේනානායක මහතා එදා පහනක් දැල්වීය. දකුණු පස සිටින්නේ තිස්ස විජයරත්න මහතායි. ඒ මහතා පසුව ප්‍රංශයේ තානාපති වශයෙන්ද සේවය කළේය. ඔහු මහනුවර දළදා මාළිගාවේ දියවඩන නිළමේ වශයෙන් කටයුතු කළ නිශ්ංශක විජේරත්න මහතාගේ වැඩිමහල් සොහොයුරාය. දැනට වසර හතරකට පෙර තිස්ස විජයරත්න මහතා මියගියේ ය.

(පින්තූරය අපට ලබාදුන්නේ බුළුවල මහතාය)

# 1948 ප්‍රථම නිදහස් උත්සවය බැලූ - බුලු

**එක්සත් රාජධානියේ දැනට වාසය කරන පැරණිම ශ්‍රීලාංකිකයා නිසැකවම ඔහුය**



බුළු තරුණ වයසේ



බුළුවල යුවල සිය මුණුපුරා සමග

අවුරුදු 60 කට පෙර බ්‍රිතාන්‍ය පාලනයෙන් ලංකාවට නිදහස ලැබී ඒ සඳහා පැවැත්වූ ප්‍රථම නිදහස් උත්සවය දුටු කෙනෙකු හමුවිය හැක්කේ ඉතා කලාතුරකිනි. වසර හැටකට පෙර ශ්‍රීලංකාවේ සිට එංගලන්තයට පැමිණ, තවමත් මෙහි ජීවත්වන ලාංකිකයෙකු ද දකින්නට බැරිය. එහෙත් එවැනි කෙනෙකු, එසේම තවමත් සිය මව්රටට අප්‍රමාණ සෙනෙහස දක්වන ලන්ඩනයේ ජීවත්වන සිංහලයෙකු මම දැන සිටිමි. ඔහු ඩී. පී. බුළුවල ය.

රසවත් නවකතාවක පමණක් දක්නා අන්දමේ විචිත්‍රතාවක් බුළුවල මහතාගේ ජීවන ප්‍රවෘත්තීන්හි ගැබ්ව තිබේ. චමත්කාරයෙන් අනූන ඒ සෑම සිද්ධියක්ම අප රටේ එවක පාලන තන්ත්‍රයේ ස්වරූපය කෙබඳුදැයි පෙන්වන කැඩ පතක් වැනිය. ලංකාවේදී අපේ ප්‍රථම අගමැති ඩී. ඇස්. සේනානායක මහතාද, සර් ජෝන් කොතලාවල මහතාද ඉතා සමීපව ඇසුරු කිරීමේ වාසනාව ලද ඔහු ඒ දෙදෙනගේ ඉතාම හිතේසිවන්ත ආරක්ෂකයා ද විය. ඔවුන් ඔහු ඇඳින්වූයේ බුළු හෝ පොඩි ඕවර්සියර් යනුවෙනි. බුලු ලන්ඩනයට ඒමට ලංකාවෙන් පිටත්වුණේ **1948** අපේ පළමු නිදහස් උත්සවයට දින හතරකට පසුවය. ඒ ගමන පිළියෙල වූ හැටි ද අසා සිටින්නට රසවත්ය.

ලංකාවට ළඟදීම නිදහස ලැබෙන බවට එකල රට පුරාම පැතිරුණු ආරංචියෙන් අප රටේ ජනතාව කුල්මත්ව සිටි අවධියකි ඒ. එකල දැන් මෙන් ශ්‍රීලංකා තානාපති කාර්යාලයක් මෙහි නොවීය. එහෙත් ලංකාව වෙනුවෙන් ට්‍රැපල්ගා චතුරශ්‍රය අසල **Dominion of Ceylon** නමැති තැනක් තිබුණි. නිදහස ලැබුණු පසු ලන්ඩනයේ ලංකාව නියෝජනය කරන්නට නියම කාර්යාලයක් අරින්නට කටයුතු පිළියෙල කළ සේනානායක මහතා ඒ ස්ථානයේ පාලක (Ctretaker) ලෙස තම ඉතාම විස්වාස වන්තයා එවන්නට හිතාගෙන මෙසේ කීවේය.

"ලන්ඩන් වල අපේ ලංකා ඔපීසියක් අපි අරිනවා. ඒක බලාගන්න මම පොඩි ඕවර්සියර් යවනවා. ලෑස්ති වෙන්න ලන්ඩන් යන්න......"

බුලු අන්දුන් කුන්දුන් වීය. ලන්ඩන් එන්නට ඔහු කිසිදාක හිතාගෙන හිටියේ නැත. මහා නිදහස් උළෙලක් පැවැත්වෙන්නට යන බව පැතිරී තිබුණි. ඊට තව ඇත්තේ දින කීපයකි. ලන්ඩන් ගියොත් එය බලන්න ලැබෙන්නේ නැත.

"මහත්තෙයො මම උත්සවේ බලලම යන්නද?" ඔහු සේනානායක මහතාගෙන් ඇසී ය.

"හා හොඳයි. එහෙනම් උත්සවේට පහුවෙන්දම නැව්නගින්න ඕන......"

**1948** පෙබරවාරි **10** වෙනි දින කොළඹ නිදහස් චතුරශ්‍රයේදී ග්ලොස්ටර්හි ආදිපාදවරයා ප්‍රධාන බ්‍රිතාන්‍ය සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් අත්‍යාලංකාර ලෙස ශ්‍රීලංකාවේ ප්‍රථම නිදහස් උත්සවය පැවැත්විණ. කොළඹ පමණක් නොව මුළු මහත් ලංකාවම එකම මඟුල් ගෙයක් වීය. නිදහස් චතුරශ්‍රය අවට ලක්ෂ සංඛ්‍යාත ජනී ජනයාගෙන් පිරීගොස් එකම හිස්ගොඩක් බවට පත්විණ. නිදහස් චතුරශ්‍ර මණ්ඩපයේ කොණක සිට උත්සවය නරඹන්නට බුළුවල මහතාට හැකිවිය. ඊට දින දෙකකට පසු ඔහු එංගලන්තය බලා නැව් නැංගේ ය.

එදා සිට ඔහු මේ මේ දක්වාම ලන්ඩනයේ ජීවත්වෙයි. ට්‍රැපල්ගා චතුරශ්‍රය අසළ වූ Dominion of Ceylon දැන් ඇමරිකානු තානාපති කාර්යාලය ඇති තැනට ගෙනයන ලදී. එතැනින් අද දවසේ හයිඩ්පාක් ගාඩන්ස්හි ශ්‍රීලංකා මහ කොමසාරිස් කාර්යාලය දක්වා එහි ආරක්ෂකයා ලෙස, වසර කීපයකට පෙර විශ්‍රාම යනතුරු බුළුවල මහතා සේවය කළේය. ඔහුගේ සේවා කාලය තුළ ලංකා මහ කොමසාරිස්වරු **17** දෙනෙකු වරින්වර ලන්ඩනයේ සේවයේ යෙදී ඇත.

ඉතා කාරුණික බුළුවල යුවල බුදුදහමට ලැදිව දරු මුණුපුරන්ගේ සුරතල් මැද ජීවත් වෙති. සැබෑ සිංහළ යුවලක්යයි ඔවුනට කටපුරා කිවහැකිය.

♦ *දයා ආනන්ද*

